# හමුදා වැන්දඹුවන් ලිංගික අල්ලසට ලක්වීම

## අනුරාධපුර, කුරුණෑගල සහ ගාල්ල දිස්ත්‍රික්ක

- සංක්ෂිප්ත පත්‍රිකාව -



Centre for Equality and Justice

© සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (Centre for Equality and Justice).
සියළුම හිමිකම් ඇවිරිණි.

නිර්මාණය: ජේමී ඇල්ෆොන්සස්
ඡායාරූප: ශානි ජයවර්ධන
රූප මූලාශ්‍රය: google.com

2018 ජූලි මස මුද්‍රණය කර ප්‍රකාශයට පත්කරන ලදිග විවෘත සමාජ පදනම් :ඔයැ ධවැඹි දජසැඑහ ඥදමඹ්ාඑසදඹ* මගින් අරමුදල් සපයන ලදිග

මෙම ග්‍රන්ථයෙහි ප්‍රකාශකර ඇති අදහස් සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූවන්ගේ අදහස් වන අතර, ඒවා අවශ්‍ය වශයෙන් සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය, ශ්‍රී ලංකා හි අදහස් සහ ප්‍රතිපත්ති පිළිබිඹු නොකරයි. මෙම ප්‍රකාශනයෙහි කිසිදු කොටසක් පූර්ණ පිළිගැනීමකින් තොරව ප්‍රතිනිෂ්පාදනය කිරීම, සමුද්ධරණ පද්ධතියක ගබඩා කිරීම හෝ ඕනෑම ආකාරයකින් හෝ ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායාපිටපත් කිරීම, පටිගත කිරීම හෝ අන් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම නොකළ යුතය.

*වැඩිදුර තොරතුරු සඳහා අමතන්න:*
සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (Centre for Equality and Justice)
325 ඒ 1, තිඹිරිගස්යාය, කොළඹ 05
දුරකථන/ෆැක්ස්: +94 11 2055404

# අන්තර්ගතය


| | |
|---|---|
| හැඳින්වීම | 3 |
| ලිංගික අල්ලසෙහි නෛතික සහ ව්‍යවස්ථාමය ගම්‍යාර්ථයන් | 4 |
| ක්‍රමවේදය | 4 |
| හමුදා වැන්දඹුවන්ගේ පැතිකඩ | 7 |
| සොයාගැනීම් පිළිබඳ විශ්ලේෂණය | 8 |
| නිර්දේශ | 15 |


මෙම අධ්‍යනය සිංහළ, දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන්හි යුද්ධයෙන් විපතටපත් කාන්තාවන්ගෙන් ලිංගික අල්ලසට ලක්වීම පිළිබඳ සිදුකළ පර්යේෂණ මාලාවේ දෙවැන්නයි.



# හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ දැනට සිංහල හමුදා වැන්දඹුවෝ 9,000 කට වඩා සිටිති. "හමුදා වැන්දඹුවක්" යනු, "යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, පොලීසිය සහ සිවිල් ආරක්ෂක බලකාය තුළ සේවාවේ යෙදීමේ සෘජු ප්‍රතිඵලයක් ලෙස සිය සැමියා මරණයට පත්ව ඇති කාන්තාවකි". ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මිතයේදී අතුරුදහන් වී ඇති සංඛ්‍යාව විශාල බැවින්, එම සේවා භටයින්ගේ භාර්යාවන් මෙන්ම, ආබාධිත තත්ත්වයට පත්වූ සේවා භටයින්ගේ භාර්යාවන්ද, "හමුදා වැන්දඹුවෝ" යන වර්ගීකරණයට ඇතුළත් කර ඇත; මෙම සන්දර්භයන් තුනෙහිම ප්‍රතිඵලය ලෙස කාන්තාවන් ගෘහ මූලිකයින් බවට පත්ව, ගෘහ ඒකකය තුළ සියළු සමාජ-සංස්කෘතික සහ දේශපාලනික-ආර්ථික වගකීම් දරන්නන් බවට පත්ව ඇත.

දශක ගණනාවක් තුළ සිදුකළ පුළුල් පර්යේෂණ පැහැදිලිව පෙන්වා දී ඇත්තේ, කාන්තා ගෘහ මූලිකයින් ගෘහ ඒකකය තුළ පිරිමියෙක් නොමැතිවීමේ හේතුවෙන් ලිංගික හිංසනය, ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස යන මේවාට විශේෂයෙන් අවදානම් සහිත වන බවයි. ඔවුන්ගේ ආර්ථික පැවැත්ම සහ සමාජ-දේශපාලනික තත්ත්වය, ඔවුන්ට සහාය සහ සේවාවන් අත්‍යවශ්‍ය වන රාජ්‍ය නියෝජිතයින්ගේ සහයෝගය මත නිතරම රඳා පවතී. මෙය ඔවුන් අවදානමට ලක්වීමට ඇති හැකියාව උග්‍ර කරයි.

සිංහල හමුදා වැන්දඹුවන්, "මියගිය රණවිරුවන්ගේ" භාර්යාවන් ලෙස ඔවුන්ට සමාජය විසින් ප්‍රදානය කළ යුතු යැයි කියනු ලබන වරප්‍රසාද සහිත තත්ත්වය තිබියදීත්, සුළුතර ප්‍රජාවන්ගේ (යුද වැන්දඹුවන් ඇතුළුව) කාන්තා ගෘහ මූලිකයින්ට වඩා අඩු මට්ටමකින් වුවද, කොන්කිරීමට සහ සූරාකෑමට ලක්වෙති. උතුරු පළාතෙහි ද්‍රවිඩ සහ මුස්ලිම් කාන්තා ගෘහ මූලිකයින් මෙන්ම සිංහල හමුදා වැන්දඹුවන් විශාල සංඛ්‍යාවක්ද, ලිංගික හිංසනයට නිරන්තරයෙන් මුහුණදෙන බවට මෙන්ම, ඔවුහු සිය සැමියන්ගේ වැටුප් සඳහා ඉල්ලුම් කිරීමේදී, බැංකු ණය ලබා ගැනීමේදී, ලියකියවිලි සහතික කර ගැනීමේදී, දරුවන් පාසැල්වලට ඇතුළත් කර ගැනීමේදී වැනි කාරණාවලදී, හමුදාවෙන් මෙන්ම අනෙකුත් බොහෝ රාජ්‍ය සහ පුද්ගලික ආයතන වෙතින් ලිංගික අල්ලස් සහ වෙනත් ආකාරවල ලිංගික සූරාකෑම වලට බලහත්කාරයෙන් පොළඹවන බවට පැමිණිලි කළහ.

එක්සත් ජාතීන්ගේ අර්ථ දැක්වීමට අනුව ලිංගික සූරාකෑම යනු "වෙනත් කෙනෙකු ලිංගික සූරාකෑමට ලක්කිරීමෙන් මූල්‍යමයව, සමාජයීයව හෝ දේශපාලනිකව වාසි ලබාගැනීම ඇතුළුව, නමුත් ඒවාට සීමානොවූ, අවදානමට ලක්වීමට ඇති හැකියාව, නා නා වෙනස්කම් දක්වන (විශේෂක) බලය, හෝ විශ්වාසය, වැනි තත්ත්වයක් ලිංගික පරමාර්ථයන් සඳහා සැබෑ ලෙස අපයෝජනය කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම" ය. ලිංගික අල්ලස යනු, ත්‍යාග සහ වාසි හෝ යම් ආකාරයක සේවා ලබාදීම වෙනුවෙන් හුවමාරුවට ලිංගික හැසිරීම් ලබාගැනීමට පෙළඹවීම් කරන ලිංගික සූරාකෑමේ සුවිශේෂී ආකාරයකි.

මෙම පර්යේෂණ අධ්‍යයනය ලිංගික අල්ලස ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ දැනට පවතින නෛතික සහ ව්‍යවස්ථාමය රාමුවෙහි දළ විශ්ලේෂණයක් සපයන අතර, සිංහල හමුදා වැන්දඹුවන් විශේෂයෙන් අවදානමට ලක්වන සන්දර්භයන් ඉස්මතු කර දැක්වීම පිණිස කුරුණෑගල, අනුරාධපුර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක වල ජීවත් වන සිංහල හමුදා වැන්දඹුවන්ගේ සිද්ධි අධ්‍යයන දහයක් සාකච්ඡාවට ලක් කරයි.

# ලිංගික අල්ලසෙහි නෛතික සහ ව්‍යවස්ථාමය ගම්‍යාර්ථයන්

- රාජ්‍ය නිලධාරීන් විසින් අල්ලස් ගැනීම ශ්‍රී ලාංකීය නීතිය උල්ලංඝනය කිරීමකි. අවාසනාවකට මෙන්, පෞද්ගලික සමාගම්, ආයතන සහ තනි පුද්ගලයින් මෙම නීති තුළට ඇතුළත් නොවන බැවින්, අල්ලස් පනත යටතේ දඬුවම් කළ නොහැක පෞද්ගලික සමාගම් සහ අනෙකුත් තනි පුද්ගලයෝ අනෙකුත් අදාළ නීති යටතේ ආවරණය වෙති.

- අල්ලස් පනතෙහි ලිංගික අල්ලස විශේෂයෙන් සඳහන් කර නොමැති අතර, "පාරිතෝෂයෙහි" (පිනවීමෙහි) අර්ථ දැක්වීම තුළ "කිනම් ආකාරයක හෝ විස්තරයකින් පහදා දෙන ඕනෑම අනුග්‍රහයක් හෝ වාසියක් ඇතුළුව" යන්න, ලිංගික වාසිද ආවරණය කරන ලෙස පහදා දිය හැකිය.

- ශ්‍රී ලාංකීය දණ්ඩ නීති සංග්‍රහය ද අවධාරණය කරනුයේ, "පාරිතෝෂය" යන වචනය මුදලට සම්බන්ධ පාරිතෝෂවලට හෝ මුදල් වලින් තක්සේරු කල හැකි පාරිතෝෂ වලට සීමා වී නොමැති බවයි. එමනිසා එයට ලිංගික පාරිතෝෂ ද ඇතුළත් කරන ලෙසට පහදා දිය හැක.

- අල්ලසෙහි ලිංගීකරණය වූ ආකාරයන් ශ්‍රී ලාංකීය ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය තුළට ඇතුළත් වන බැවින්, ලිංගිකත්වය මත පදනම් වූ වෙනස් කොට සැළකීමේ ඕනෑම ආකාරයක් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වේ.

- එවැනි ක්‍රියාවක් එය සිදුකරන රජයේ විධායක හෝ පරිපාලනමය අංශයට අයත් පාර්ශවය මත රඳා පවතී. පෞද්ගලික සමාගම්, ආයතන සහ තනි පුද්ගලයින් මෙහි සඳහන් කර නොමැත.

# ක්‍රමවේදය

- මෙම පර්යේෂණ අධ්‍යයනය හරහා ශ්‍රී ලංකාවේ වෙනස් පළාත් තුනක් තුළ පිහිටි දිස්ත්‍රික්ක තුනක, එනම්, කුරුණෑගල (වයඹ පළාත), අනුරාධපුරය (උතුරු මැද පළාත), සහ ගාල්ල (දකුණු පළාත) තුළ, විවිධ, බොහෝවිට බහුවිධ, ලිංගික අල්ලස් සහ සූරා කෑමේ සිද්ධීන්ට මුහුණ දුන් හමුදා වැන්දඹුවන් දස දෙනෙකු වෙත අවධානය යොමු කරන ලදී.

- හමුදා වැන්දඹුවන් වැඩිම සංඛ්‍යාවක් ජීවත් වනුයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බවටත් (28%), ඊට ආසන්න සංඛ්‍යාව ලෙස වැන්දඹුවන් 25%ක් අනුරාධපුරයෙහි සිටින බවටත් මීට පෙර සිදුකළ පර්යේෂණ තුළින් හෙළිවූ දේ මත, මෙම දිස්ත්‍රික්ක තුන තෝරා ගැනීම පදනම් විය.

- තුන්වන වැඩිම ජනගහනය (19%) මහනුවර දිස්ත්‍රික්කයෙහි වුවත්, සම්මුඛ සාකච්ඡා පැවත් වූ මැයි සහ ජූලි යන මාස තුළ, රටෙහි අයහපත් කාලගුණික තත්ත්වයන් පැවති බැවින් අධ්‍යයනයෙන් එම දිස්ත්‍රික්කය බැහැර කිරීමට සිදුවිය. මහනුවර දිස්ත්‍රික්කය වෙනුවට හමුදා වැන්දඹුවන් 13% ක් සිටින ගාල්ල දිස්ත්‍රික්කය තෝරාගන්නා ලදී.

- සිද්ධි අධ්‍යයන සඳහා සියළුම සම්මුඛ සාකච්ඡා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින පළපුරුදු පර්යේෂිකාවක් විසින් සිංහල භාෂාවෙන් පවත්වන ලදී. සෑම දිස්ත්‍රික්කයකම සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ හමුදා වැන්දඹුවන් සමග දිගුකාලීන ආශ්‍රයක් සහ මිත්‍රත්වයක් තිබූ ප්‍රදේශයේ ක්‍රියාකාරිකයෙකු පර්යේෂිකාව කැටුව යන ලදී. සම්මුඛ සාකච්ඡාවට සහභාගි වන්නන්ගේ විශ්වාසය සහ සැක නැති බව තහවුරු කිරීමට මෙය අත්‍යාවශ්‍ය විය.

- සවිස්තරාත්මක ප්‍රශ්නාවලියක් සකස් කර තිබුණු නමුත්, සිද්ධි අධ්‍යයන සඳහා දත්ත එක්රැස් කිරීමට වඩාත්ම ඵලදායී ක්‍රමවේදය



> “අවසානයේදී මෙවැනි ලිංගික හැසිරීම්වලට පෙළඹවීම් කරන්නේ යැයි දොස් පවරන්නේ පැමිණිල්ල ඉදිරිපත් කරන කාන්තාවට ම යැයි මම දැක තිබෙනවා”

වන්නේ විවෘත සංවාදයන් බව පර්යේෂිකාව විසින් හොඳින් දැන සිටීම හේතුවෙන්, සම්මුඛ සාකච්ඡාව තුළ ආවරණය කළ යුතු ක්ෂේත්‍රයන් පිළිබඳව මාර්ගෝපදේශයක් ලෙස පමණක් ඇය විසින් එම ප්‍රශ්නාවලිය භාවිතා කරන ලදී.

- විශ්වාසය ගොඩනගා ගැනීමට මෙන්ම ලිංගික අල්ලස් පිළිබඳ තවදුරටත් විස්තර ලබා ගැනීමේ අරමුණින්, සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවෙකු බොහෝවිට එක් වරකට වඩා බැහැදකින ලදී.

- පර්යේෂණ ව්‍යාපෘතිය පුරාවටම සිහියේ තබා ගත යුතු ඉතා වැදගත් අංගයක් වූයේ, ද්‍රවිඩ සහ මුස්ලිම් කාන්තා ගෘහ මූලිකයින් සහ වෙනත් සිංහල කාන්තා ගෘහ මූලිකයින් මෙන් නොව, හමුදා වැන්දඹුවන් හට හමුදාව සමග, සහ තවදුරටත් රජය සමගද, පැහැදිලිව සකස් වූ යැපුම් සම්බන්ධතාවක් පවතින බවය. මෙයට හේතුව වී ඇත්තේ, ජීවිතක්ෂයට පත්වූ සිය සැමියාගේ වැටුප හෝ හමුදා විශ්‍රාම වැටුප, මුළුමනින්ම හෝ ඉන් සැළකිය යුතු ප්‍රමාණයක් ඔවුන් සිය මූලික යැපුම් මාර්ගය ලෙස ලබා ගැනීම.



- මෙම වැටුප/විශ්‍රාම වැටුප ලබාගැනීම සඳහා හමුදා වැන්දඹුවට, හමුදා සේවක පිරිස්වල සහ රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය සහ හොඳ හිත, විවිධ පරිපාලනමය මට්ටම් තුළදී අවශ්‍ය වන බැවින්, මෙම සේවක පිරිස් විසින්ම ඇයව ලිංගිකව ගොදුරු කර ගැනීමට බොහෝ දුරට ඉඩ ඇති නිසා, ඒ ගැන පැමිණිලි කිරීම කෙසේ වෙතත්, ඒ ගැන කතා කිරීමට පවා මෙම කාන්තාවන් තුළ විශාල බියක් සහ අකැමැත්තක් පවතී.
- හමුදා වැන්දඹුවන් පළිගැනීම් පිළිබඳව කෙතරම් බිය වීද යත්, කාන්තාවන් 15 දෙනෙකු සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වුවත්, ඔවුන්ගෙන් 5 දෙනෙක් ඔවුන්ගේ සිද්ධි අධ්‍යයන මෙම වාර්තාවෙහි ඇතුළත් නොකරන ලෙස ඉල්ලා සිටියහ.
- සිය සිද්ධි අධ්‍යයන ඇතුළත් කිරීමට එකඟ වූ කාන්තාවෝ, ඔවුන්ව ලිංගිකව ගොදුරු කර ගත් අයගේ නම් සඳහන් නොකරන ලෙස ඉල්ලා සිටියහ. තවද, තමාව ලිංගිකව ගොදුරු කරගත් තැනැත්තා ස්ථානගතවී සිටි හමුදා කඳවුර හෝ රජයේ කාර්යාලය පවා නම් නොකරන ලෙසද ඔවුහු ආයාචනා කළහ.
- ඉහත ඉල්ලීම්වලට ගරුකරන ලද අතර, ව්‍යාජ නම් භාවිතා කිරීමෙන් සහ ඔවුන් ස්ථානගතව සිටින ග්‍රාමයන් හෝ දිස්ත්‍රික්ක ලැයිස්තු ගත නොකිරීමෙන් සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන්ගේ අනන්‍යතාව සැඟවීමට විශේෂ උත්සාහයක් දරන ලදී.
- මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය වූ, ඉදිරිපත් කර ඇති පැමිණිල්ලක් ගැන පසු විපරම් කිරීමට අවශ්‍ය වූ, නීතිමය මාර්ගයකට යාමට කැමති වූ හෝ මනෝ-සමාජයීය උපදේශන ලබාගැනීමට කැමති වූ, සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ ඕනෑම කෙනෙකුට, තොරතුරු සැපයීමට සහ/හෝ සහාය දැක්වීමට සෑම උත්සාහයක්ම දරන ලදී.

# හමුදා වැන්දඹුවන්ගේ පැතිකඩ

- මෙම කාන්තාවන්ගෙන් බහුතරයක් වැන්දඹු වන විට ඉතා තරුණ වයසේ සිටි අතර ඔවුන්ට බොහෝවිට ඔවුන්ගෙන් යැපුණු ඉතා කුඩා දරුවෝ සිටියහ.
- කාන්තාවන් කිහිප දෙනෙකුට ඔවුන්ගේ සැමියාගේ වැටුපෙන්, දරුවන්ට අමතරව දෙමාපියන්ට ද, එක් සිද්ධියක් තුළ, සොහොයුරන් දෙදෙනෙකුට ද, සහයෝගය දීමට සිදුවිය.
- බොහෝ වැන්දඹුවන් හට ඔවුන්ගේ සැමියාගේ වැටුප ලැබෙන තෙක්, මාස ගණනාවක් බලා සිටීමට සිදුවිය. ඒ වනතුරු, ඔවුන්ට දෙමාපියන්ගෙන් සහ සැමියාගේ ඥාතීන්ගෙන් යැපීමට සිදුවූ අතර, සැමියාගේ ඥාතීහු බොහෝ විට ඔවුන්ට ඉතා කෲර ලෙස සැළකූහ.
- කාන්තාවන් දෙදෙනෙකු හට, සැමියාගේ වැටුපෙන් 25% ක් ඔවුන්ගේ සැමියාගේ දෙමාපියන්ට යන බැවින්, ඔවුන්ට ලැබෙන්නේ 75% ක් පමණි. මෙම කොටස ලබාගැනීමට වුවද එක් කාන්තාවක් හට වසර 5 ක් බලා සිටීමට සිදුවිය.
- මෙම කාන්තාවන්ගෙන් බහුතරයක් ඉතා මූලික මට්ටමේ අධ්‍යාපනයක් පමණක් ලබා තිබීම සහ නිපුණතාවන් නොමැතිවීමේ හේතුවෙන් තිරසාර ආකාරවල රැකියා අවස්ථා සලසා ගැනීමට නොහැකි විය.
- එක් කාන්තාවක් හැර අන් සියල්ලෝ රැකියා විරහිත වූ අතර, මසකට රු.10,000 සිට රු.50,000 දක්වා පරාසයක වූ සිය සැමියාගේ වැටුප මත, සම්පූර්ණයෙන්ම යැපුණහ.
- බොහෝ කාන්තාවන් දිගටම තනිකඩව සිටියේ, නැවත විවාහ වුවහොත් සිය සැමියාගේ වැටුප අහිමි වන නිසාය. (වසර 2007 ට පෙර, සන්නද්ධ හමුදා/පොලිස් නිලධාරීන්ගේ වැන්දඹුවන් හට නැවත විවාහවීමේදී වැටුප/විශ්‍රාම වැටුප අහිමි විය. 2007 නොවැම්බර් මසට පසු, වැන්දඹුව නැවත විවාහ වීමේදී, වසර 10 ක් සඳහා වැන්දඹුවට හිමිකම් පවතින වැටුපෙන් සහ දීමනාවලින් 75% ක් එක්වර මුදලින් ලබා දුනි (ෆෝකුස් විමෙන් 2016ආ: 21).
- කාන්තාවන්ගෙන් බහුතරයක්, සිය සැමියා විසින් හෝ ඔවුන් විසින්, ඔවුන්ගේ නිවස ගොඩ නැඟීම පිණිස ලබාගත් ණය බරට යටත් වී සිටිති.
- කෙසේ වෙතත්, බොහෝ කාන්තාවන් හට ඔවුන්ගේම නිවස හෝ පැලක් සාදාගෙන වියපත් දෙමාපියන්ට හෝ වෙනත් නෑදෑයින්ටද සළකමින්, සිය දරුවන් සමග ස්වාධීනව ජීවත්වීමට හැකියාව තිබුණි.

> "මේ වනතුරු මා සිතා සිටියේ, එය බලය සහිත තනතුරුවල සිටින පිරිමින් වෙතින් අවදානම් සහිත, හුදකලා වූ කාන්තාවන් මෙවැනි හිරිහැරවලට මුහුණ දෙන කනගාටුදායක යථාර්ථයක් බවයි."

> ඔහු පුදුමාකාර අන්දමට අනුන් ගැන සිතන පුද්ගලයෙක් බව ලෝකයට පෙන්වමින් මගේ ඥාතියෙක්ද වන නිසා මගේ අසල්වැසියෝ කිසිවක් සැක කළේ නැහැ.

- කාන්තාවන්ගෙන් බහුතරයක් සඳහන් කළේ ඔවුන්ට දැඩි තනිකමක් දැනෙන බවත්, ආදරය සහ මිත්‍රත්වය ලබාගැනීමට දැඩි ආශාවකින් සිටින බවත්ය.

- රාජ්‍ය සහ හමුදා සේවක පිරිස් වෙතින් පමණක් නොව, ඔවුන්ගේ සගයින්, අසල්වාසීන්, ඥාතීන් සහ එක් අවස්ථාවකදී, බෞද්ධ භික්ෂුවකගෙන් ද, ඔවුන්ට දිනපතා මුහුණදීමට සිදුවන ලිංගික සූරාකෑම පිළිබඳව ඔවුහු විශ්වාස භංගත්වයෙන් කතා කළහ.

- ඔවුන්ගේ මානසික යහපැවැත්ම අතිශයින් දුර්වල වී කාන්තාවන් සත් දෙනෙක් ඔවුහු මානසික අවපීඩනයෙන් පෙළෙන බව ප්‍රකාශ කළහ. මෙම කණ්ඩායමෙහි 4 දෙනෙක් ඔවුන්ට සිය දිවි නසා ගැනීමේ සිතුවිලි නිතරම ඇතිවූ බව විශේෂයෙන් සඳහන් කළ අතර, සිය දිවි හානිකර ගැනීමට උත්සාහ කළ එක් කාන්තාවකට මනෝ චිකිත්සක ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවිය. ඇය වෛද්‍ය ප්‍රතිකාර ගැනීම දිගටම සිදුකරන්නීය.

## සොයාගැනීම් පිළිබඳ විශ්ලේෂණය

- ලිංගික සූරාකෑමෙහි සහ ලිංගික අල්ලසෙහි විවිධ ආකාරයන්, පීතෘ මූලික සහ කාන්තාවන් ප්‍රමාණවත් ලෙස අගය නොකරන, ඔවුන්ට ගරු නොකරන, ශ්‍රී ලාංකීය සමාජයෙහි පුළුල් සන්දර්භය තුළ අවබෝධ කර ගත යුතුය. එක් කාන්තාවක්, “මම සමාජ සේවා ක්‍රියාකාරකම් මෙන්ම දේශපාලනික ක්‍රියාකාරකම්වල බොහෝ සේ නියැලී සිටියත් මේ පිරිමි කවදාවත් ඔබ කරන වැඩ පිළිබඳව ඔබව අගය කරන්නේ නැහැ. ඔවුන්ගේ ඇස් ඉදිරිපිට ඔබ නිකම් ලිංගික භාණ්ඩයක් පමණයි” යනුවෙන් පවසා එය හොඳින් සාරාංශගත කළාය.

- පිරිමින් විසින් වැන්දඹුවන් සහ තනිකඩ කාන්තාවන්, අවදානම් සහිත, නම්මා ගත හැකි, සහ ලිංගික ගොදුරු බවට පත්කර ගැනීමට පහසු අය ලෙස දැකීම, ශ්‍රී ලාංකීය සමාජය තුළ සියළුම ස්ථර අතර පවතින පොදු සංසිද්ධියකි. ආර්ථික මට්ටමින් දුර්වල වැන්දඹුවන් සහ තනිකඩ කාන්තාවන්, රාජ්‍ය සහ හමුදා ආයතන වලින් සේවාවන් අපේක්ෂා කිරීම වැනි, බල අසමානාත්මතාවය පවතින සන්දර්භයන් තුළ මෙම තත්ත්වය තවත් උග්‍රවේ.

> එදා පටන් ඔහු මගෙන් පළිගත්තා.



> මගේ සැමියා ද හමුදාවේ සිටි නිසා, හමුදාව පිළිබඳ මෙවැනි නොහොබිනා අංග අපි ප්‍රසිද්ධ කරන්නේ කෙසේද?

- බොහෝ කාන්තාවන් ලිංගික අල්ලස් පිළිබඳ බහුවිධ අවස්ථාවලට මුහුණ දී ඇත. බොහෝ ලිංගික සූරාකෑමේ අවස්ථාවන්හි බලපෑම අවසන් වී හෝ මඟ හැරී ඇති අතර, සමහරක් බලපෑම දිගින් දිගටම මෙම කාන්තාවන්ගේ ජීවිත තුළ විශාල ලෙස පෙනෙන්නට තිබේ. එමෙන්ම අන් ඒවා දිගින් දිගටම පවතී.

- බොහෝ කාන්තාවෝ තමා මුහුණ දුන් ලිංගික අල්ලසෙහි සිද්ධිය පිළිබඳව මිතුරියකට හෝ ඥාතියෙකුට විශ්වාසයෙන් පවසා තිබුණි. කෙසේවෙතත්, වැන්දඹුවන් තිදෙනෙක් හැර, ඔවුන් පිටස්තරයෙකුට ඒ ගැන පැවසූ ප්‍රථම වතාව මෙය විය.

- සම්මුඛ සාකච්ඡාවට සහභාගිවූවන් සඳහන් කළ ලිංගික අල්ලස් සිද්ධීන් අතරින්, ඒවා ගැන පැමිණිලි කළේ වැන්දඹුවන් තිදෙනෙක් පමණි - එනම්, පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපති වෙත සහ එක් යුද හමුදා කඳවුරක අණදෙන නිලධාරී වෙත ය. එක් වැන්දඹුවකගේ මව සිය දියණියව ලිංගිකව ගොදුරු කර ගැනීමට පැමිණි තැනැත්තාට සෘජුවම අභියෝග කර ඇත.



- එක් පැමිණිල්ලක් හෝ බරපතළ ලෙස සළකා නොබැලීම සහ අපරාධකරුවන් හට දඬුවම් නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස වැන්දඹුවෝ තව දුරටත් අපේක්ෂා භංගත්වයට පත් වූහ. ගොදුරු කර ගැනීමට පැමිණි තැනැත්තා හට සෘජුවම අභියෝග කළ සන්දර්භය තුළ සිදුවූයේ එය ප්‍රතික්ෂේප කිරීම සහ වැඩිදුර චෝදනාවලට ලක් කිරීමය. මේ හේතුවෙන් වැන්දඹුවගේ මානසික ස්ථාවරත්වය තවදුරටත් පිරිහීමට ලක්ව ඇත.

- ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස පිළිබඳ සිද්ධීන් හමුදා වැන්දඹුවන් මත ප්‍රබල මානසික පීඩනයක් පටවා ඇත. සම්මුඛ සාකච්ඡාවට සහභාගිවූවන් සඳහන් කළේ සිද්ධිය අතරතුර සහ ඉන්පසුව ඔවුහු පිළිකුල, ලැජ්ජාව, කණගාටුව, කෝපය සහ අපේක්ෂා භංගත්වය යන හැඟීම් අත්දුටු බවයි. එක් කාන්තාවකට සියදිවි නසාගැනීමේ හැඟීම් ඇතිවී තිබුණි.

- දෙමාපියන්, සොයුරු සොයුරියන් සහ සමීප මිතුරන් ලිංගික අල්ලස් ඉල්ලීම්වලට ප්‍රතිරෝධය දැක්වීමට මෙම කාන්තාවන් හට සහායවීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටුකර ඇත. ඔවුන් සානුකම්පිතව සවන් දී, උපදෙස් ලබා දී, ආරක්ෂාව ලබාදී සහ ලිංගික ගොදුරු ගන්නන් හට අභියෝග කිරීම පවා කර ඇත.

“

**මහ රෑ ලියකියවිලි අත්සන් කරන්න යන්නේ කවුද?” යි පවසමින් මා ඔහුට බැණ වැදුණා**

”

- සමහර කාන්තාවන් ලිංගික සූරාකෑමට එරෙහිව සටන් කිරීමේදී ඔවුන්ගේ ඇතුළාන්ත ශක්තිය සහ අධිෂ්ඨානය භාවිතා කර තිබුණි. එක් කාන්තාවක් ඇයට මුහුණදීමට සිදුවූ තත්ත්වය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමේ අරමුණින් මානව හිමිකම් වැඩමුළුවකට සහභාගී වූවාය.

- අපරාධකරුවන් /විත්තිකරුවන්

ලිංගික ගොදුරු ගත් අයගෙන් බහුතරයක් රාජ්‍ය නියෝජිතයෝ වූහ:

- හමුදා සේවක පිරිස් (සිද්ධීන් 5 ක්)
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරන්නන් (සිද්ධීන් 3 ක්)
- පොලිස් නිලධාරීන් (සිද්ධින් 2 ක්)
- රාජ්‍ය බැංකුවක කළමනාකරු (සිද්ධීන් 2 ක්)
- ග්‍රාම නිලධාරී (එක් සිද්ධියක්)
- ජාතික පාසැලක විදුහල්පති (එක් සිද්ධියක්)
- තැපැල් ස්ථානාධිපති (එක් සිද්ධියක්)

පෞද්ගලික අංශයේ තනි පුද්ගලයින් විසින් ලිංගික ගොදුරු ගත් අය අතර:

- තිදෙනෙක් හමුදාවට සම්බන්ධ අය වූ අතර, මෙයට ඥාතීන් දෙදෙනෙක් (එක්කෙනෙක් දැනට සේවයේ නියුතුව සිටින අතර, එක් කෙනෙක් හමුදාවෙන් විශ්‍රාම ගොස් ඇත), සහ රණවිරු සංසදයේ සභාපති වූ ආබාධිත සෙබළෙක් ද වූහ.
- අනෙක් පෞද්ගලික අංශයේ තනි පුද්ගලයා මාර්ග කොන්ත්‍රාත් කරුවෙකු විය.

සැළකිල්ලට ගත යුතු කරුණක් වන්නේ, සිද්ධි අධ්‍යයන තුළ සඳහන් කර ඇති බොහෝ නිලධාරීන් දැනටමත් ලිංගික ගොදුරු ගන්නන් ලෙස අපකීර්තියට පත්ව සිටීමයි. කෙසේවෙතත්, ඔවුන්ට එරෙහිව කිසිම නිල පැමිණිල්ලක් කර නොමැති නිසා, ඔවුහු නිදැල්ලේ ඔවුන්ගේ ලිංගික ගොදුරු ගැනීම නොනවත්වා කරගෙන ගියහ. සමහර නිලධාරීන්ට එරෙහිව පැමිණිලි කළ විට, ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු එම චෝදනාව ගැන සැහැල්ලුවෙන් සළකා, ඔවුන් වෙනුවෙන් නිදහසට කරුණු ඉදිරිපත් කර, තවදුරටත් එම කාරණය නොසළකා සිටියහ.

- ලිංගික අල්ලසට මඟ පෑදූ වාතාවරණයන්
  - ලිංගික අල්ලස් සිදුවීම් අවබෝධ කර ගත යුත්තේ මෙම වැන්දඹුවන් ලිංගික ගොදුරු බවට පත්වීමේ අවදානමට නිරාවරණය වන ඔවුන්ගේ ජීවිතවල පුළුල් සන්දර්භය තුළය.
  - මෙම සියළුම වැන්දඹුවෝ ඔවුන්ගේ සැමියාගේ වැටුප මත යැපෙති. ලිංගික අල්ලස් සිද්ධීන් 3ක් සිදුවූයේ ඔවුන් මෙම වැටුප ලබා ගැනීම සඳහා ලියකියවිලි වල කටයුතු සම්පූර්ණ කර ගැනීමට උත්සාහ කළ විටය.
  - බොහෝ හමුදා වැන්දඹුවන්ගේ කේන්ද්‍රීය අරමුණ වී ඇත්තේ ඔවුන් සහ ඔවුන්ගේ දරුවන් සඳහා නිවසක් ගොඩ නඟා ගැනීම හෝ ඔවුන්ගේ සැමියන් මුල පිරූ නිවසෙහි වැඩ කටයුතු/අළුත්වැඩියා කටයුතු සම්පූර්ණ කර ගැනීමය. මේ සඳහා ඔවුන්ට හමුදාවෙන් හෝ රාජ්‍ය බැංකුවකින් නිවාස ණය ලබාගැනීමට අවශ්‍ය වන අතර, වැඩිපුරම ලිංගික අල්ලස් සිද්ධීන් සංඛ්‍යාවක් (සිද්ධීන් 6 ක්) සිදුවී ඇත්තේ එහි ප්‍රතිඵලය ලෙසය.
  - ඔවුන්ගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීමට උත්සාහ ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ලිංගික අල්ලස් සිද්ධීන් 3 ක් සිදුවිය.
  - ප්‍රජා සංවර්ධන කටයුතුවල නායකත්වය ගන්නා වූ සහ ඒවායේ සක්‍රියව නියැලෙන වැන්දඹුවන්ද ඉලක්කගත වී ඇත (සිද්ධීන් 3 ක්).

- ලිංගික අල්ලසෙහි ආකාරයන්
  - රාත්‍රියේදී වැන්දඹුවගේ නිවසට මත් වී ගොස් ලිංගික තෑග්ගීන්/වාසි ඉල්ලා සිටීම.

- ලිංගික හිංසනය සහ නුසුදුසු ශාරීරික හැසිරීම්.
- කුළුපඟකමක් ආරම්භ කිරීමට ඉල්ලා සිටීම.
- එක් වරක් පමණක් හෝ ලිංගිකව සම්බන්ධ වීම සඳහා ඉල්ලා සිටීම.
- දුරකථනය හරහා දිගින් දිගටම කරන ලිංගික හිංසනය.
- අපරාධකරුව තනිව සවස් වරුවේ කාර්යාලයෙන් පිටතදී හමුවන ලෙස හෝ ඔහු සමග ගමනක් යාමට එන ලෙස වැන්දඹුවගෙන් ඉල්ලා සිටීම.
- කාමුක ප්‍රකාශ සහ ලිංගික ඇනුම්පද වලට යටත් වීමට සිදුවීම මෙන්ම, සාමාන්‍ය මුණගැසීමක දී අනවශ්‍ය තරම් ළෙන්ගතු, විමසිලි සහගත ප්‍රශ්න කිරීම්වලට යටත් වීමට සිදුවීම.
- ලිංගික අල්ලස ප්‍රතික්ෂේප කිරීම හෝ මඟහැරීම කළ විට වාචික තර්ජන හෝ ප්‍රමාද කිරීමේ උපායයන්.

සැළකිල්ලට ගත යුතු කරුණක් වන්නේ, වැන්දඹුවන් අතර කිසිවෙක් කිසිම ලිංගික අල්ලස් ඉල්ලීමකට සත්‍ය වශයෙන් එකඟ නොවූ බවයි. කෙසේවෙතත්, එක් කාන්තාවක් විසින් හුදු විශ්වාස භංගත්වයෙන් එසේ කිරීමේ හැකියාව පිළිබඳව සළකා බලන ලදී.

ලිංගික ගොදුරු බවට පත්වීමට ප්‍රතිරෝධය දැක්වූ, සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවන්නන්ගෙන් බහුතරය, ඔවුහු අන්තරාදායක තත්ත්වයක් නවතාලීමට/මඟහැර ගැනීමට/පලවා හැරීමට උපයෝගී කරගත් විවිධ උපක්‍රම බෙදා හදා ගත්හ. එවැනි උපක්‍රම පුළුල් පරාසයක විහිදුණු අතර සමහර ඒවා අන් ඒවාට වඩා සාර්ථක වී ඇත:

- ඔවුන් සෙවූ සේවාව/අනුග්‍රහය අත්හැර දැමීම.
- ගොදුරු කරගන්නාට වාග් ප්‍රහාරයක් එල්ල කිරීම.
- ඔහුට පහර දීමට සැළැස්වීම.
- පැමිණිල්ලක් කිරීම.
- මඟහැරීම.
- ජංගම දුරකතන අංකය වෙනස් කිරීම.
- මිතුරියකගේ ලිපිනය භාවිතා කිරීම.
- වඩා කාරුණික හමුදා නිලධාරීන්ගෙන් උදව් ඉල්ලීම.
- රහසේ හමුවන ස්ථානයට පවුලේ පිරිමි සාමාජිකයෙක් කැටුව යාම.
- ඔවුන් වෙනුවෙන් පවුලේ පිරිමි සාමාජිකයෙකු මැදිහත් වීමට සැළැස්වීම.

■ කාන්තාවන් පැමිණිලි ඉදිරිපත් නොකිරීමට ප්‍රධාන හේතු වූයේ:

1. හමුදාවේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ පළිගැනීම් වලට බිය වීම, මෙසේ කෙරෙන පළිගැනීම් වලට, ණය පිළිබඳව කටයුතු ප්‍රමාද කිරීම, ඉතා වැදගත් ලියකියවිලි "අස්ථාන ගත වීම", ගෙවීම් නොගෙවා රඳවා තබා ගැනීම, මානසික රෝහලකට යොමු කිරීම, පසුපස විත් කරදර කිරීම, වැන්දඹුවට සහ ඇගේ දරුවන්ට තර්ජනය කිරීම සහ හානි පැමිණවීම.

"මම දැන් මුළු පිරිමි ජාතිය සමඟම කළකිරීමකින් සිටින්නේ ඔවුන් මාව සෑම විටකදීම හිංසනයට ලක් කළා."

“

මම වස බී දිවි නසා ගැනීමට ද උත්සාහ කළා.

”

2. කීර්තිය සහ ගෞරවය අහිමි වේ යැයි බිය සහ සමාජ අපවාදය: “අවසානයේදී මෙවැනි ලිංගික හැසිරීම්වලට පෙළඹවීම් කරන්නේ යැයි දොස් පවරන්නේ පැමිණිල්ල ඉදිරිපත් කරන කාන්තාවට ම ය” යනුවෙන් කාන්තාවෝ කිහිපදෙනෙක් පැවසූහ. සමහර හමුදා වැන්දඹුවෝ ඔවුන්ගේ දරුවන්, සැමියාගේ ඥාතීන් ආදීන් හට මේ සිද්ධීන් ගැන ආරංචි වුවහොත්, තමන් පිළිබඳව වරදවා සිතනු ඇතැයි කරදර වූහ.

» කාන්තාවන් හට ඔවුන්ව විශ්වාස නොකරනු ඇතැයි හැඟීමට හේතුවූයේ:

✓ ඇය දුප්පත් සහ දුබල වීම.
✓ ඇයට යෝජනා ඉදිරිපත් කළ තැනැත්තා ඇයට වඩා බොහෝ තරුණ වීම.
✓ එම සිද්ධිය “මාගේ වචනයට එරෙහිව ඔහුගේ වචනය” වීම.
✓ පැමිණිලි ගැන “උදාසීනත්වයෙන් සහ නොසැළකිල්ලෙන්” සොයා බැලීම.

» එක් කාන්තාවකට හැඟුණේ “එය මාව කබලෙන් ලිපට වැටීම” වැන්නක් වන බවයි. එනම්, තවදුරටත් කරදරේ වැටීමය.



> මට වඩා බොහෝ සේ බාල තරුණයෙක් මට ආශා කරන බව විශ්වාස කරන්නේ කවුද?

- තවත් කාන්තාවක් ඇගේ පැමිණිල්ල සටහන් කර ගන්නා පොලිස් නිලධාරියා හෝ හමුදා නිලධාරියා ඇයව ලිංගික හිංසනයට ලක් කරතැයි බිය වූවාය.
- නීතිය බලාත්මක කරන නිලධාරීන් දූෂිත සහ ඉතාමත් නරක ලිංගික ගොදුරු ගන්නන් බවට කාන්තාවන් අතර පොදු එකඟතාවක් තිබුණි.
- උදව් සහ වන්දි ලබාගැනීම සඳහා අයැදිය හැකි ස්වාධීන, රාජ්‍ය නොවන අධිකාරීන් ගැන බොහෝ කාන්තාවෝ දැනුවත් වී නොසිටියහ.
- මානව හිමිකම් කොමිෂන් සභාව ගැන දැනුවත් වී සිටි එක් කාන්තාවක් ඔවුන් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුත්තේ කෙසේදැයි නොදන්නා බව සඳහන් කළාය.
- මෙම අධම විස්තර ප්‍රසිද්ධ කළහොත් ඔවුන්ගේ දරුවන් අවමානයට සහ නිග්‍රහයන්ට ලක්වේ යැයි කාන්තාවන්ගෙන් බහුතරයක් සැළකිලිමත් වූහ.
- සමහරු, ඔවුන්ගේ පැමිණිලි කිරීම් හේතුවෙන් ඔවුන්ගේ මියගිය සැමියන්ට මෙන්ම හමුදාවට ද නරක නාමයක් ගෙන එතැයි යන්න ගැන කරදර වූහ.
- සම්මුඛ සාකච්ඡාවට සහභාගිවූවන්ගෙන් බහුතරයක්, බොහෝ කාලය සහ මුදල් වැය වන නිසා නීති පද්ධතිය හරහා ඔවුන්ට යම් පිහිටක් ලබා ගැනීමට හැකි වේ දැයි යන්න ගැන ද සැක පළ කළහ: "මට මේ රටේ නීති ගැන කිසි විශ්වාසයක් නැහැ.. මේ රටේ නිසි නීති සහ ආචාර ධර්ම පද්ධති තිබුණා නම්, මිනිස්සු අප වැනි අවදානම් සහිත කාන්තාවන්ට මෙසේ සළකන්නේ නැහැ".
- කාන්තාවන් දෙදෙනෙක්, තනි පුද්ගලයින් ලෙස ඉදිරිපත් වීමට වඩා සමූහයක් ලෙස කළ හැකි නම්, වන්දි ලබාගැනීම පිණිස නීතිමය මාර්ගයක් ගැනීමට කැමැත්ත පළ කළහ.
- තවත් කෙනෙක් පැවසුවේ, ඇයව ලිංගිකව ගොදුරු කර ගැනීමට පැමිණි තැනැත්තාට එරෙහිව සාක්ෂි දීමට කැමති වන්නේ, ඇයට එය නිර්නාමිකව කළ හැකි නම් පමණක් බවයි.

> මෙහි අපව පාලනය කිරීමට පිරිමින් නොමැති බැවින් අපි බොහෝ නිදහසේ ජීවත්වෙනවා.



# නිර්දේශ

- ලිංගික පාරිතෝෂයන් සඳහා වැඩි දණ්ඩන ලබාදීම පිණිස අල්ලස් පනත සංශෝධනය කළ යුතුය.
- එවැනි දණ්ඩන සහ, කාන්තා ගෘහ මූලිකයින් හට ලබා ගත හැකි අනෙකුත් නෛතික පිහිටාධාර ගැන ඔවුන්ව දැනුවත් කළ යුතුය.
- නීතිමය පියවර ගැනීමට අදහස් කරන කාන්තා ගෘහ මූලිකයින් හට නීතිමය සහාය නොමිලේ සැපයිය යුතුය.
- හමුදා සේවක පිරිස් ඇතුළුව, සියළු රාජ්‍ය නිලධාරීන් සඳහා ලිංගික සූරාකෑම සහ අල්ලසට සම්බන්ධ ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කර, නිල භාෂා තුනෙන්ම, සියළුම රාජ්‍ය කාර්යාල තුළ ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කර තැබිය යුතුය.
- සෑම රාජ්‍ය ආයතනයකම, ලිංගික අල්ලස ගැන පැමිණිලි කිරීමට කාන්තාවන්ට අනුබල දෙන උපකාරක පරිසරයක් සපයා දිය යුතුය.
- රාජ්‍ය අංශය තුළ ලිංගික හිංසනය, ලිංගික අල්ලස සහ ලිංගික සූරාකෑම පිළිබඳ, පැමිණිලි ආමන්ත්‍රණය කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශයන්, මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකසා, සියළු රාජ්‍ය කාර්යාල වලට එම තොරතුරු බෙදා හැරිය යුතුය.
- ලිංගික අල්ලස සහ අනෙකුත් ආකාරවල ලිංගික හිංසනය සහ ලිංගික සූරාකෑම ගැන කටයුතු කිරීමට, විශේෂ, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී පැමිණිලි ක්‍රියාපටිපාටියක්, මානව හිමිකම් කොමිෂන් සභාව තුළ පිහිටුවිය යුතුය.
- සියළු රාජ්‍ය කාර්යාල මගින් ලිංගික අල්ලස් සිද්ධීන් ගැන දත්ත ගබඩාවක් පවත්වා ගෙන යා යුතු අතර, මෙවැනි සිද්ධීන් විමර්ශනය කර ලිංගික ගොදුරු ගන්නන් හට දඬුවම් කිරීම සහතික කිරීමට වාර්ෂික විගණනයක් පැවැත්විය යුතුය.

- ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස් ගැටළු ගැන සාකච්ඡා කිරීමට පමණක් නොව, මෙවැනි ගැටළු මතු කරන කාන්තාවන් කරදරකාරී අපවාදකරණයට ලක්වීම ආමන්ත්‍රණය කිරීමට, පාසැල් මට්ටමින් ආරම්භ කර, දිගු දුර ව්‍යාප්ත වන්නා වූ දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කළ යුතුය.

- හමුදා සේවක පිරිස්, රාජ්‍ය නිලධාරීන් සහ පොදුවේ සමාජය තුළ, කාන්තාවන් සහ විශේෂයෙන් වැන්දඹුවන් කෙරෙහි, සැළකිය යුතු ආකල්පමය වෙනසක් තිබිය යුතුය.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකම තුළ පැතිරී පවතින, ලිංගික අල්ලස ගැන දැනුවත් කිරීම පිණිස, මාධ්‍ය විසින් වඩා ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටුකළ යුතුය.

- කාන්තා ගෘහ මූලිකයින්ට සේවා සැපයීමට කාන්තා නිලධාරිනියන් හට වැඩියෙන් පත්වීම් ලබාදිය යුතුය.

- විවිධ කාරණා සඳහා කොළඹට ගමන් කිරීමට කාන්තා ගෘහ මූලිකයින්ට සිදුනොවන ලෙස කලාපීය කාර්යාල පිහිටුවිය යුතුයි එවිට කාන්තා ගෘහ මූලිකයින් හට, ඔවුන් කැටුව යාමට, ඔවුන් වෙනුවෙන් මැදහත්වීමට පිරිමින් වෙත යැපීමට, සහ එම ක්‍රියාවලිය තුළ ඔවුන්ට ලිංගික අල්ලස් ලබාදීමට සිදුනොවනු ඇත.

- හමුදා වැන්දඹුවන් හට මියගිය සැමියාගේ වැටුප නිකුත් කිරීමට සරල, ඉක්මන් සහ කාර්යක්ෂම ක්‍රියාවලියක් පිහිටුවිය යුතුයි එවිට අවමංගල්‍ය වියදම් ආවරණය කර ගැනීම, ගෙදරදොර නඩත්තු කර ගැනීම, පැහැර හැරීමෙන් තොරව ණය ගෙවා ගැනීම, ආදිය ඉටු කර ගත හැකිවේ.

- හමුදා වැන්දඹුවන් හට ඔවුන් මුහුණ දෙන අමාරුකම් දැඩි විශ්වසනීයත්වයකින් බෙදාහදා ගෙන ඒවා ආමන්ත්‍රණය කළ හැකි කෙසේද යන්න ගැන උපදෙස් ලබාගැනීම පිණිස, ආර්ථික සහ මනෝවිද්‍යාත්මක ගැටළු යන දෙකම මත අවධානය යොමුකරන උපදේශන මධ්‍යස්ථාන, හමුදාවෙන් ස්වාධීනව, පිහිටුවිය යුතුය.

- මනෝ-සමාජීයීය උපදේශනය මියගිය හමුදා සේවක පිරිස් වල දූ දරුවන්ට ද ලබාදිය යුතුය.



සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය
**(Centre for Equality and Justice)**
325 ඒ 1, තිඹිරිගස්යාය, කොළඹ 05.
දුරකථන/ෆැක්ස්: +94 11 2055404